පල්ලේපොල ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය

-----------------------

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ---------------------------- |
| වත්කම් සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් අක්කර 12 රූඩ් 2 පර්චස් 33.58 ක් වූ ඉඩම් 21 ක් හා ප්‍රමාණය සඳහන් නොවූ ඉඩම් 3 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. | රජයේ තක්සේරුව සඳහා වත්කම් ඉදිරිපත් කර තක්සේරුවක් ලබා ගැනීමට කඩිනමින් කටයුතු කරමි. |

1.3.2 නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.29,569,870 ක් වූ ගිණුම් විෂයයන් 13 කට අදාළ ශේෂයන් හා අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.960,744 ක නොසැසඳීමක් පැවතුණි. | ගිණුම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | වැය ලෙජරයේ ශේෂයන් ජ'නල් සටහන් සමඟ ගැළපූ පසු එන මූල්‍ය ප්‍රකාශනයේ ඇති ශේෂයේ වී ඇති වෙනස්කම් පිළිගනිමි. මෙය ආදායම් වියදම් ගිණුමේ මූල්‍ය ප්‍රතිඵලයට බලපෑමක් නොමැති බව දන්වමි. |

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ලැබිය යුතු ගිණුම් | | |
| වර්ෂ 3 කට වැඩි කාලයක් ඉක්මවූ ලැබිය යුතු ශේෂයන්ගේ එකතුව රු.4,152,554 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කඩකුලී හා අත්තිකාරම් මේ වන විට අයකර ගෙන ඇත. ණයගැතියන්ගෙන් මේ වන විට රු.1,081,327.76 මුදලක් අයකරගෙන ඇති අතර අක්කර බදු හා ජල ගාස්තු 75% ක් පමණ අයකරගෙන ඇත. වරිපනම් බදු රු.115,125 ක මුදල අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) ගෙවිය යුතු ගිණුම් | | |
| වර්ෂ 3 කට වැඩි කාලයක් ඉක්මවූ ගෙවිය යුතු ශේෂයන්ගේ එකතුව රු.2,850,624 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | තැන්පත් ගිණුමේ පවතින ගෙවිය යුතු රු.342,067 ක මුදල් සම්බන්ධයෙන් අදාළ අය දැනුවත් කිරීමටත් ඉන් පසුව ඉතිරිවන මුදල සභා අරමුදලට ගැනීමටත් කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ උපලේඛන A 'අ' කොටසේ 31 වගන්තිය | බල ප්‍රදේශය තුළ පවත්වාගෙන ගොස් තිබූ ගෝඝාතකාගාරයක් සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | මේ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මධ්‍යම පරිසර අධිකාරියට යොමු වී පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීමට කටයුතු කරන ලෙසට කර්මාන්තකරුට උපදෙස් ලබාදී ඇත. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වර්ෂ ගණනාවක සිට සභාවේ වාහන 6 ක ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. | කැබ්රථයේ ඉන්ධන දහන පරීක්ෂාව 2018 මැයි 24 දින සිදු කළ අතර අනිකුත් වාහන වල හා කැබ් රථයයේද 2019 වර්ෂය සඳහා ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට සූදානම් කරමින් පවතී. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.22,422,916 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,277,901 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2018 ඇස්තමේන්තු ගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම්හා බදු | 4,892,000 | 5,767,345 | 5,586,732 | 1,952,798 | 4,900,000 | 5,748,132 | 5,535,964 | 1,711,579 |
| (ii) | කුලී | 462,000 | 569,327 | 481,471 | 137,862 | 442,400 | 456,359 | 466,360 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 800,000 | 671,870 | 671,80 | - | 700,000 | 607,520 | 626,945 | - |
| (iv) | වෙනත් ආදායම් | 11,210,500 | 8,103,556 | 10,964,632 | 7,198,957 | 20,184,000 | 12,906,771 | 10,464,833 | 7,019,924 |
| | | 17,364,500 | 15,112,098 | 17,032,835 | 9,289,617 | 26,226,400 | 19,718,782 | 17,094,102 | 8,731,503 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 දෙසැම්බර් 31 දිනට රු.8,731,503 ක් වූ මුළු හිඟ ආදායම සමාලෝචිත වර්ෂය අවසානයේ රු.9,289,618 ක් ලෙස රු.558,115 කින් වර්ධනය වී තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ස්ථිර ආදායම් පරීක්ෂක මහතෙකු නොසිටි බැවින් හිඟ ආදායම් හා ආදායම් රැස් කිරීම අවම විය. |

### 2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟහිටි වරිපනම් ශේෂය රු.237,834 ක් වූ අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර හිඟ වරිපනම් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන අනුගමනය කර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව දේපළ තහනම් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. අවසන් නිවේදන ද ලබාදී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2012 වර්ෂයට පසුව බල ප්‍රදේශය තුළ තුළ දියුණු ප්‍රදේශ හඳුනා ගැනීම හා ඒ අනුව නව වරිපනම් සීමා පුළුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු වේ. | දියුණු කළ ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා අවශ්‍ය විධිවිධාන යොදා ඇත. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 135 වගන්තිය යටතේ ගැනෙන වරිපනම් නිදහස් කළ දේපළ ලැයිස්තුවක් සකස් කර නොතිබුණි. | අදාළ ලේඛන පිළියෙල කළ යුතු වේ. | වරිපනම් බද්දෙන් නිදහස් දේපළ සම්බන්ධයෙන් වරිපනම් ලේඛනයේම සටහන් තබා ඇති අතර ඉදිරියේදී නිදහස් දේපළ ලැයිස්තුවක් සකස් කිරීමට කටයුතු කරමි. |

2.2.4 ජල ගාස්තු

-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.1,672,003 ක් විය. | හිඟ ජල ගාස්තු අය කළ යුතු වේ. | ඉදිරියේදී ජංගම සේවයක් මඟින් ජල ගාස්තු අය කර ගැනීමට කටයුතු යොදා ඇත. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.680,380 ක් හා මුද්දර ගාස්තු රු.6,518,307 ක් විය. | හිඟ ගාස්තු අයකර ගත යුතු වේ. | ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.680,380 ක මුදලින් 2019 වර්ෂය තුළ රු.395,332 ක මුදලක් ලැබී ඇත. මුද්දර ගාස්තු මධ්‍යම පළාත් සභාව වෙත දන්වා යවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | අනුමත ප්‍රතිපාදන මුදල රු.700,000 ක් වූ කර්මාන්ත 3 ක් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි. | සැලසුම් ප්‍රකාරව වර්ෂය තුළ කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයේ ඉටු කිරීමට නොහැකිවූ කර්මාන්ත 3 ක් 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අනුමත වී ඇත. |
| (ii) | 2015 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු ගොඩනැඟිලි 3 ක ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ නොකිරීම නිසා එම ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | ඉදිකිරීම් සම්පූර්ණ කර ගොඩනැගිලි ඵලදායීව උපයෝජනය කළ යුතු වේ. | තඹගිටියාව ආදාහනාගාරය හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා ඉදිකළ ගොඩනැඟිල්ල කඩ කාමර 2 ක් ලෙස ඉදිකිරීම් වැඩ ආරම්භ කර ඇත. පල්ලේපොල නාගරික රැස්වීම් ශාලාවේ ඉහළ මහලෙහි සංවර්ධන කටයුතු සැලසුම් කර ඇත. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015, 2016 හා 2017 වර්ෂවල රු.1,489,948 ක් වැය කර ඉදි කර තිබූ කොම්පෝස්ට් අංගනයේ ඉදිකිරීම් හා අනෙකුත් පහසුකම් සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් කසළ කළමනාකරණ කටයුතු සඳහා ඵලදායීව යොදා ගැනීමට නොහැකි වී තිබුණි. | අඩුපාඩු සම්පූර්ණ කර කසළ කළමනාකරණ කටයුතු කඩිනමින් ආරම්භ කළ යුතු වේ. | ප්‍රතිපාදන ලැබෙන්නේ නම් ව්‍යාපෘතිය ඉතා සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි බව දන්වමි. |

(ඇ) පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රාදේශයේ දෛනිකව රැස්වන කසළ කිලෝග්‍රෑම් 200 ක පමණ ප්‍රමාණයක් නිසි කළමනාකරණයකින් තොරව බැහැර කිරීම හේතුවෙන් පාරිසරික ගැටලු රාශියක් මතුවී තිබුණි. | කසළ කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අප සභාව මඟින් එකතු කරනු ලබන කසළ දඹුල්ල මහ නගර සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන කළමනාකරණ ව්‍යාපෘතියට ලබාදීමට අදහස් කර ඇත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍ය ඉලක්කයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණුවලට අනුව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවය අතහැර ගිය, මියගිය හෝ ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 11 දෙනෙකුට අයත් රු.27,501 ක ඇප තැන්පත් මුදල් නිදහස් නොකර රඳවාගෙන තිබුණි. | අදාළ ඇප මුදල් නිදහස් කළ යුතු වේ. | පෙන්වා දී ඇති නිළධාරීන් 11 දෙනාගේ සේවක ඇප තැන්පත් ඉදිරියේදී ගෙවීමට කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත තනතුරුවල පුරප්පාඩු 22 ක් පැවතුණි. | පුරප්පාඩු වූ තනතුරු සම්පූර්ණ කළ යුතු වේ. | පත්වීම් නිලධාරියා වන සභා ලේකම් විසින් පුරප්පාඩුගත තනතුරු 12 ක් සඳහා බඳවා ගැනීම් කර ඇත. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් දීර්ඝ කාලයක සිට පරිහරණය කරන ඉඩම් 4 කට හා සුසාන භූමි 46 කට හිමිකම් ඔප්පු හා මිනුම් සැලසුම් නොතිබුණු අතර ප්‍රාදේශීය සභාව සතු සුසාන භූමි 13 ක් ආරක්ෂා කරගෙන නොතිබුණි. | ඉඩම්වල අයිතිය නිරවුල් කර ගත යුතු වේ. | ප්‍රාදේශීය සභාව දැනට භාවිතා කරන හිමිකම් ඔප්පු නොමැති සියලු (රජයේ ඉඩම්) සුසාන භූමි ලෙස පවත්වාගෙන කොටස් නිරවුල් කරදෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය ලේකම් වෙතින් ඉල්ලීමක් කර ඇත. |

3.4.2 පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පරිහරණය කරමින් පවතින වෙනත් ආයතන වෙත හිමිකම ඇති වාහන 4 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගත යුතු වේ. | වාහන 2 ක එහි ඉස්මතු කර දක්වා ඇති කරුණු හේතුවෙන් පවරා ගැනීම් සිදුකර ගැනීමට නොහැකිව ඇත. යතුරුපැදි ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) | ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයට අනුව අක්කර 2 යි පර්චස් 31 ක් වූ සුසාන භූමි 3ක් හා ප්‍රමාණය සඳහන් නොවූ තවත් ඉඩම් කොටස් 16 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම්වල අයිතිය සනාථ කර ගැනීමට අවශ්‍ය නීතිමය ලියකියවිලි සකස් කළ යුතු වේ. | මෙම ඉඩම් කොටස් සඳහා නීත්‍යානුකූල ලියවිලි සභාව සතුව නොපවතින අතර 2019 වර්ෂයේදී මෙම කොටස් මැන සභාව නමින් නීත්‍යානුකූල ලියවිලි සකස් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | කසළ බැහැර කිරීමට යොදාගෙන තිබුණු ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් පර්චස් 60 ක ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් මෙම ඉඩම බදු/ කුලී පදනම මත සභාව වෙත ලබාදීමේ කාර්යය ඉටු කළ යුතුව ඇත. තවද මෙම කාර්යය කඩිනමින් ඉටු කර දෙන ලෙස අවස්ථා කීපයකදීම සභාව විසින් ඉල්ලීමක් කර ඇත. |

3.4.3 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉඩම් අනුබෙදුම් පොදු ඉඩම් කට්ටි ලෙස ප්‍රාදේශීය සභාව වෙත පවරණ ලද ඉඩම් කැබලි 9 ක් පොදු අවශ්‍යතා සඳහා හෝ ප්‍රාදේශීය සභාවේ පොදු සේවා කටයුතු සඳහා උපයෝජනය කිරීමට කටයුතු නොකර කැලෑවැදී තිබුණි. | සභාවට අයත් ඉඩම් ඵලදායීව උපයෝජනය කළ යුතු වේ. | අදාළ ඉඩම් මේ වන විට එළිපෙහෙළි කර ඵලදාව බදු දී ආදායම් ඉපයීමටත්, පොදු කටයුතු සඳහා යොදා ගැනීමටත් කටයුතු සිදුවෙමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රු.1,305,900 ක් වටිනා යන්ත්‍රෝපකරණ හා වාහන අයිතම 4 ක් හා වටිනාකම හඳුනාගත නොහැකි යන්ත්‍රෝපකරණ අයිතම 8 ක් නිෂ්කාර්යව පැවතුණි. | අලුත්වැඩියා කළ හැකි උපකරණ හා වාහන අලුත්වැඩියා කිරීමටත්, අලුත්වැඩියා කළ නොහැකි උපකරණ හා වාහන සම්බන්ධව අපහරණ ක්‍රියාමාර්ගයන් අනුගමනය කළ යුතු වේ. | අදාළ යන්ත්‍ර හා උපකරණ පිළිබඳ තාක්ෂණික වාර්තාවක් ලබාගෙන ඉදිරියේදී අලුත්වැඩියාව හෝ භාවිතයට ගත නොහැකි නම් වෙන්දේසි කිරීමට හෝ කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | 1996 වර්ෂයේ විවෘත කර 2013 වර්ෂයේ සිට අක්‍රියව පවතින මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක රු.36,729 ක ශේෂයක් පැවතුණි. | ඉතිරි කිරීමේ ගිණුම ඵලදායීව යොදවා ගත යුතු වේ. | මහජන බැංකුවේ අංක 24120015007124 දරන ඉතිරි කිරීමේ ගිණුමේ ඇති රු.36,729 ක මුදල සභාවේ ආදායමට ගැනීමට ඉදිරියේ දී කටයුතු කරමි. |

3.4.4 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ රියදුරු පුරප්පාඩු හේතුවෙන් වාහන දෙකක්, JCB යන්ත්‍රයක් හා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර 2 ක් ඌන උපයෝජිතව පැවැතුණි. | වාහන නිසි පරිදි උපයෝජනය කළ යුතු වේ. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත වී ඇති රියදුරු තනතුරු සඳහා බඳවාගෙන ඇති අතර අලුතින් ලද වාහන සඳහා රියදුරු මහතුන් බඳවා ගැනීමට තනතුරු අනුමැතිය සඳහා යවා ඇත. |

3.5 ප්‍රසම්පාදනය

3.5.1 ප්රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 අනුව ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර තිබුණද කරන ලද නියැදි පරික්ෂාව පරිදි ඊට පරිබාහිරව රු.3,278,640 ක මිලදී ගැනීම් සිදු කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වේ. | විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | තඹගිටියාව ආදාහනාගාරයේ ඉතිරි වැඩ නිම කිරීම | | |
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 ප්‍රකාරව සමිතියකට එක්වර ලබාදිය හැකි කොන්ත්‍රාත්වල වටිනාකම රුපියල් මිලියන 2 ක් නොඉක්මවිය යුතු වුවත්, ඇස්තමේන්තු දෙකක් සකස් කර ප්‍රජා මණ්ඩලයක් වෙත එකතුව රු.3,526,668 ක් වූ එම කොටස් දෙකම එකම දින ගිවිසුම් අත්සන් කර ලබාදී තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | ආදාහනාගාරයේ ඉතිරි වැඩ නිම කිරීමේ II ව්‍යාපෘතිය පොල්වත්ත ස්වශක්ති ප්‍රජාමණ්ඩලය මඟින් ඉටුනොකළ අතර එම ව්‍යාපෘතිය ඉටුකිරීමට නොහැකි බව දන්වා එම ප්‍රජා මණ්ඩලය මඟින් ලිඛිතව දන්වා ඇත. |
| (ආ) | 2019 පෙබරවාරි 07 දින වන විට ගිවිසුම් අත්සන්කර දින 38 ක් ගතවී ඇතත් කර්මාන්තයේ වැඩ ආරම්භකර නොතිබූ අතර ගිවිසුම් ප්‍රකාරව පෙබරවාරි 28 දින කර්මාන්තය අවසන් කළ යුතුව තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | ආදාහනාගාරයේ ඉතිරිවැඩ නිම කිරීමේ II ව්‍යාපෘතියේ වැඩ කොටස් ඉටුකෙරෙමින් පවතින අතර දහන කුටිය හා චිමිනිය ඉදිකිරීමේ වැඩ කොටස් ඉටුකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් ආරම්භ කිරීම ප්‍රමාද විය. ප්‍රජා මණ්ඩලයේ ඉල්ලීමට අනුව ගිවිසුම් කාලය මසකින් දීර්ඝ කර ඇත. |